# ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
# 2026 වසර සඳහා දේශීය සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

## (බී/37/2025)

2026 වසර සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවාවන් සැපයීම සහ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සඳහා **ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව** යටතේ ලියාපදිංචි වීමට අපේක්ෂිත නිෂ්පාදකයින්, සැපයුම්කරුවන් හා ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්, අලෙවිකරුවන්, කොන්ත්‍රාත්කරුවන්, සේවා සපයන්නන් සහ ව්‍යාපාරික ආයතනවලින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## ඒ : සැපයුම්

1. ඇලුමිනියම් වෑද්දුම්කරණයට අදාල සියලුම ද්‍රව්‍ය සහ උපාංග (Aluminum Extrusions & Accessories)
2. බැටරි (වාහන සඳහා / ආරෝපනය කළ හැකි)
3. ඇඳ ඇතිරිලි, කොට්ට උර, ටී ෂර්ට්, අත්පිස්නා, වාහන ඔප දැමීමේ රෙදි (Polishing Cloths), කපු වැරලි (Cotton Waste)
4. පරිගණක යන්ත්‍ර ආශ්‍රිත උපකරණ (ටෝනර්,කාට්රිජ්,රිබන්,පෙන්ඩ්‍රයිව් සහ වෙනත්,,,,)
5. පරිගණක සහ ජාලගත කිරීමේ උපකරණ
6. පරිගණක ආශ්‍රිත උපාංග (ප්‍රින්ටර්, ස්කැනර්, යූ.පී.එස් සහ වෙනත්)
7. කාඩ් බෝඩ් ඇසුරුම්
8. විදුලි හා ඉලෙක්ට්‍රොනික් උපකරණ (රූපවාහිනි, විදුලි පංකා, විදුලි කේතල, ගණක යන්ත්‍ර, කැමරා සහ වෙනත්..)
9. විදුලි හා ඉලෙක්ට්‍රොනික් අයිතම හා උපාංග (ස්විච්, බල්බ, වයර් සහ වෙනත්)
10. සාමාන්‍ය ඉදිකිරීම් ද්‍රව්‍ය (සෙරමික් ටයිල්, නාන කාමර උපාංග, ඇණ,මුරිච්චි,ජී.අයි පයිප්ප, යකඩ තහඩු, පීවීසී පයිප්ප හා උපාංග, තීන්ත වර්ග (සියළු තීන්ත වර්ග , ඉනමල්, එමල්ෂන් සහ වෙනත්)
11. සැහැල්ලු යන්ත්‍ර සූත්‍ර සහ ආයුධ
12. කාර්යාලීය උපකරණ (ගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, අත්පිටපත් යන්ත්‍ර සහ වෙනත්..)
13. කාර්යාලීය ගෘහ භාණ්ඩ ( වානේ /දැව)
14. කාර්යාලීය ලිපි ද්‍රව්‍ය (පෑන්, පැන්සල්, ලිපි කවර, කඩදාසි සහ වෙනත්)
15. පුද්ගල ආරක්ෂක හා ප්‍රවේසම් උපකරණ
16. බටහිර ඖෂධ වර්ග
17. ප්ලාස්ටික් ඇසුරුම් (Poly Cans, /පොලිතින් බෑග් (Poly Bags) ඇලුෆොයිල් බෑග් (Alufoil Bags) සහ පොලිතින් බෑග් මුද්‍රණ කටයුතු
18. මුද්‍රණ කටයුතු
19. සපත්තු (Safety Shoes, Pump Shoes, Work Boots, Gum Boots, Sandals etc..)
20. ආරක්ෂක නිල ඇඳුම් (හිස් වැසුම් වර්ග, බඳපටි,බැජ් සහ වෙනත්
21. මෝටර් රථ අමතර කොටස් (වෑන්, කාර්, ජීප්, ලොරි, ත්‍රී රෝද රථ)
22. ටයර් සහ ටියුබ්
23. නිල ඇඳුම් රෙදි ( කලිසම් සහ කමිස රෙදි )

## බී : වැඩ /සේවාවන්

01. ගොඩනැගිලි, පිවිසුම් මාර්ග සහ අංගන ඉදිකිරීම් හා අලුත්වැඩියාව, ඉන්ධන පිරවුම්හල් වල පරණ යකඩ තඩාග ඉවත් කිරීම, තඩාග ස්ථාපනය කිරීම නල එලීම හා රුපියල් මිලියන පහට (05) අඩු වටිනාකමක් ඇති අනෙකුත් සිවිල් ඉංජිනේරුමය වැඩ කටයුතු
02. ගොඩනැගිලි සේවාවන් (යාන්ත්‍රික,විදුලි,ජලනළ,මළාපවාහන සහ අනෙකුත් සේවාවන්)
03. වාහන අලුත්වැඩියාව හා නඩත්තුව (කාර්මික/විදුලි /පින්තාරු සහ ටින්කරින් /වායු සමීකරණ/සීට් කවර දැමීම/ සහ අප්හෝල්ස්ට්‍රි වැඩ/ මෝටර් රථ සඳහා කැසට් යන්ත්‍ර/ රිවස් කැමරා සවිකිරීම /විල් එලයින්මන්ට්)
04. සියළුම වර්ග වලට අයත් වාහන සේවා කිරීම (පූර්ණ/අර්ධ)
05. Zn/AL වහලය සහ සිවිලිම ඉදිකිරීම/අලුත් වැඩියා කිරීම
06. ඇලුමිනියම් වැද්දුම් වැඩ, ලෝහ සිවිලිම් සහ ටෙම්පර්ඩ් වීදුරු වැඩ
07. ඉඩම් සහ ගොඩනැගිලි වල මිණුම් කටයුතු
08. වායුසමීකරණ සැපයීම සහ සවිකිරීම
09. මධ්‍යම වායුසමීකරණ පද්ධති වල සේවා කටයුතු
10. ස්ප්ලිට් වර්ගයේ වායුසමීකරණ පද්ධති වල සේවා කටයුතු
11. භූමි අලංකරණ කටයුතු /ඉන්ටර්ලොක් වර්ගයේ ගල් ඇතිරීම
12. පරිගණක සහ පරිගණක මුද්‍රණයන්ත්‍ර අළුත්වැඩියාව සහ සේවා කටයුතු
13. ගිනි හා ප්‍රවේසම් කටයුතු සඳහා භාවිතාකරණ උපකරණ අළුත්වැඩියාව හා සේවා කටයුතු
14. භූගත ටැංකි (3000 IG, 5000 IG) පිරිසිදු කිරීම
15. වෙළඳ ප්‍රචාරක කටයුතු (Advertising & Promotional Items, Event Management & Public Relations, Designing, Printing Services, Digital Marketing)

## අයදුම්කරුවන් සඳහා නියමයන් සහ කොන්දේසි

a) මිල ගණන් කැඳවීම සිදුකරනු ලබන්නේ ලියාපදිංචි සැපයුම්කරුවන්, බලයලත් අලෙවිකරුවන්, නිෂ්පාදකයින් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමනි. කෙසේ වෙතත් අවශ්‍ය අවස්ථාවන්හී දී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතෙහි ලියාපදිංචි නොවූ බලයලත් අලෙවිකරුවන්, නිෂ්පාදකයින් සහ කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ අයිතිය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුවනු ඇත.

b) 2025 වර්ෂය සඳහා දැනටමත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ලියාපදිංචි වී සිටින සැපයුම්කරුවන්, බලයලත් අලෙවිකරුවන්, නිෂ්පාදකයින් සහ කොන්ත්‍රාත්කරුවන් 2026 වර්ෂය සඳහා ලියාපදිංචි වීමට නැවත අයදුම් කළ යුතුය.

c) මිල ගණන් ඉදිරිපත් නොකරන හා නියමිත වේලාවට භාණ්ඩ හා සේවා සැපයීමට අපොහොසත් වන හෝ ප්‍රමිතියෙන් තොර භාණ්ඩ සහ සේවා සපයන ආයතන ලියාපදිංචි නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.

d) බස්නාහිර පලාත තුල ලියාපදිංචි ගරාජ් සහ වාහන සේවා ආයතන පමණක් බී- 2 , 3 (ගරාජ් සහ වාහන සේවා) අංශ යටතේ ලියාපදිංචි කරගනු ලැබේ.

e) සියළුම සැපයීම් සහ සේවා සඳහා දින තිහක (30) කාලසීමාවක් තුල ගෙවීම් සිදු කරනු ඇත.

# <u>අයදුම්පත් ලබා ගැනීම/ ඉදිරිපත් කිරීම</u>

a) සැපයීම් සහ සේවා සඳහා ලියාපදිංචි වීමට බලාපොරොත්තු වන අයදුම්කරුවන් තම ලිපි ශීර්ෂය යටතේ **කළමනාකාර ප්‍රසම්පාදන හා ගබඩා** වෙත ලිඛිත ඉල්ලීමක් සිදුකල යුතු අතර එහිදී තමන් ලියාපදිංචි වීමට අපේක්ෂිත අයිතමයන් වෙන වෙනම සඳහන් කල යුතුය.

b) අයදුම්පත්‍ර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයේ පලමු මහළෙහි ප්‍රසම්පාදන අංශයෙන් 0900 පැය සිට 1500 පැය දක්වා ලබා ගත හැක.

c) අයදුම්පත්‍ර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වෙබ් අඩවිය www.ceypetco.gov.lk/public tenders/registration forms වෙත පිවිසීමෙන්ද බාගත කරගත හැක.

d) **අයදුම්පත්‍ර නිකුත් කරනු ලබන අවසාන දිනය 2025.10.31**

e) එකතුකල අගය මත බදු ගෙවීම පිලිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ලිපිය හා අනෙකුත් අදාළ ලියකියවිලි සහිතව නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **<u>2025 නොවැම්බර් මස 04 වන දින හෝ ඊට පෙර</u>** කළමනාකාර (ප්‍රසම්පාදන හා ගබඩා), ප්‍රසම්පාදන හා ගබඩා අංශය, පලමු මහළ, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, අංක 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 09. වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ගෙනවිත් භාරදීමට හැක.

f) ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ

# <u>අයදුම්පත් සඳහා ගෙවීම්</u>

a) සැපයීම් සහ සේවා සඳහා ලියාපදිංචි වීමට එක අයිතමයක් සඳහා ආපසු නොගෙවනු ලබන **රු 300.00** මුදලක් ගෙවිය යුතු වන අතර එකට වැඩිවන සෑම අයිතමයක් සඳහාම රු. 300.00 බැගින් ගෙවිය යුතුය.

b) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අයකැමි වෙත මුදල් ගෙවීම සිදුකල හැක**.**

පැහැදිලි කර ගැනීමට වෙනත් කරුණු ඇතොත් දුරකථන අංක 0117-296333/6 සහ (ෆැක්ස් 0112 -106769 ) හෝ supplies@ceypetco.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය මඟින් මා අමතන්න.

කළමනාකාර (ප්‍රසම්පාදන හා ගබඩා),
ප්‍රසම්පාදන හා ගබඩා අංශය,
පළමු මහළ, ලංකා ඛනිජ නීතිගත සංස්ථාව,
නො 609, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09.